

එක්සත් රාජධානියේ ශ්‍රීලංකා මහකොමසාරිස්වරයා වන ගරු නිහාල් ජයසිංහ මැතිතුමා විසින් පෙබර වාරි 4 වන දින උදයේ ලන්ඩනයේ මහකොමසාරිස් කාර්යාලය සඳළුතලයේ ශ්‍රීලංකා ජාතික ධජය ඔසවමින් 62 වන ශ්‍රීලංකා නිදහස් උත්සවය සිය කාර්යාලයේ ආරම්භ කළ අයුරුය මේ.

# 62 වන ශ්‍රීලංකා නිදහස් උත්සවය

## මහ කොමසාරිස්තුමා විසින් නිදහස් දින උළෙලේදී පවත්වන ලද කථාව

ගරු සංඝයා වහන්ස
ගරු පූජකවරුනි
නෝනාවරුනි මහත්වරුනි

ත්‍රස්තවාදය තුරන් කොට යළි ඒකීය රටක් බවට පත් ශ්‍රීලංකාවේ 62 වන නිදහස් උළෙල සමරමින් මෙසේ ඔබ අමතන්නට ලැබීම මට ඉමහත් සතුටකි.

ඔබ දන්නා පරිදි මේ ඉතා නුදුරු දිනයක නිමාවූ ජනපතිවරණය වසර 30 කට පසු සමස්ථ දිවයින පුරාම පැවැත්වූ ප්‍රථම ඡන්ද විමසීමයි. අද අප මෙහි රැස්ව සිටින්නේ නව ශ්‍රීලංකාවක සාමාජිකයන් හැටියටයි.

ශ්‍රීලංකාවේ වෙසෙන අපේ සහෝදර ජනතාවට අද මරාගෙන මැරෙන බෝම්බ, බස්බෝම්බ හෝ වෙනයම් ත්‍රස්තවාදී තර්ජණයකට ලක් නොවී බියෙන් සැකෙන් තොරව නිදහසේ ජීවත්වන්නට හැකියාව ලැබී තිබේ. අපේ ජනතාව අද කැමති අන්දමක, කැමති දෙසක නිදහසේ සැරිසරති. මෙතෙක් කල් නොතිබුණු ඒ නිදහස නොසිතු විරු ලෙස සැබැවින්ම ඔවුන් වෙත ළඟා වී ඇත.

1948 දී අපේ දේශය අධිරාජ්‍ය බැම්මවලින් මිදී නිදහස ලබා ප්‍රථම වරට ජාතික ධජය එසවූ නමුත් අද මේ සමර 62 වන නිදහස්දා අපේ බලාපොරොත්තු තවත් පෙරට ගොස් ඇත. කෙසේ නමුත් මෙම නිදහස අත්පත් කරගැන්ම සඳහා කරන ලද ජීවිත පරිත්‍යාගයන්ද අපේ ජනතාව විඳි අනේක දුක් කම්කටොළුද අප අමතක කළ යුතු නොවේ.

1948 දී එක ලේ බිඳුවකුදු නොසලා නිදහස ලැබූ වෙමුයි කියමින් අප උදම් අන්නත් අප ජාතිය ගොඩ නැංවීම ආරම්භ කර ඇත්තේ මේ දැන් ය.

අනාගත බලාපොරොත්තු සහ අද දක්නට ඇති සුබ ලකුණු අනුව කල්පනාකරන කල අප ඉදිරියේ සාමකාමී සෞභාග්‍යමත් අනාගතයක් ඇති බව පෙනේ.

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සිය ජනපතිවරණ ජයග්‍රහණයේදී පැවසුවේ තමා ශ්‍රීලංකාවේ සියළු ජනතාව ගේම ජනාධිපතිවරයා බැවින් දැඩි අධිෂ්ඨානයකින් යුතුව සියළු ජනතාවගේ යහපත උදෙසා කටයුතුකරන බව ය.

නෝනාවරුනි මහත්වරුනි, එසේම සියළුම ශ්‍රීලාංකි කයින් ද එතුමන් තම නායකයා ලෙස සලකමින් ජාතිය ගොඩ නගන්නට එතුමාට සහාය දෙනවා ඇතැයි යන්න මගේ අවංක බලාපොරොත්තුවයි. ඔබ සැමට ස්තුතියි!



පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ

Duke's Court Travel

Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan | SriLankan Airlines | fr £365 + Taxes |
| QATAR AIRWAYS | Qatar Airways | fr £289 + Taxes |
| KUWAIT AIRWAYS | Kuwait Airways | fr £200 + Taxes |
| Emirates | Emirates | fr £445 + Taxes |
| ETIHAD | Etihad Airways | fr £294 + Taxes |
| OMAN AIR | Oman Air | fr £163 + Taxes |

Note: All fares mentioned are low season / terms & conditions apply.

020 8748 3535

AITO IATA

204 King Street, London W6 0RA

මහමෙව්නාව භාවනා අසපුව
Mahamevnawa Meditation Centre UK

මාසික ළමා සදහම් හමුව
සැම මසකම දෙවෙනි
සති අන්තයේ සෙනසුරාදා
ප. ව. 3.00 සිට 5.30
දක්වා පහත සඳහන්
ස්ථානයේදී පැවැත්වේ
Mahamevnawa Bhavana
Asapuwa
56 Sheepcot Lane
Watford
Herts WD25 0DG

සීල භාවනා වැඩසටහන
සැම මසකම දෙවෙනි
සති අන්තයේ ඉරිදා
පෙ.ව. 8.00 සිට ප.ව.4.30
දක්වා මෙම ස්ථානයේදී
Leavesden Green
Community Centre
Clarke Green
Off Clarke way
Watford
Herts WD25 0BW

පිං කැමති සියල්ලෝ පැමිණෙත්වා!
Asapuwa - 0192 3689027 ( 8pm-10pm) Viraj-0783 7988237
Web: www.mahamevna.org.uk
email: admin@mahamevna.org.uk

ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න

Transfer Fees From only £5

FAST CASH
SEND TODAY - COLLECT TODAY

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

COMMERCIAL BANK BOC HNB HSBC
සම්පත් බැංකුව SampathBank PEOPLE'S BANK Standard Chartered
Strong. Safe. Reliable. MCG Mike Cooke Group

www.efastcash.biz
020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT

